"ශාස්තෘවරයකු යනු ඔබටත් ශාස්තෘවරයකු වීමට මග පෙන්විය හැකි අයෙකි, ඔබත් දෙවියන් වහන්සේත් එක් අයකු බවත් ඔබටත් ශාස්තෘවරයකු වියහැකි බවත් ඔබට අවබෝධ කරවීමට හැකි අයෙකි. එපමණකි. ශාස්තෘවරයකුගේ කාර්යය එපමණකි"

වින්හයි ශාස්තෘවරිය

අපේ මාර්ගය ආගමක් නොවේ. අප කිසිවකු බුද්ධාගමට, කතෝලික ආගමට හෝ වෙනත් ආගමකට හරවා නොගනිමු. ඔබ කවුරුන් දැයි දැනගැනීමටත්, ඔබ පැමිණියේ කොහි සිටදැයි දැනගැනීමටත්, මේ මහ පොළව මත ඔබට ඇති දූත මෙහෙවර මතක් කරදීම සඳහාත්, ලෝකය තුළ ඇති අභිරහස් සොයා දැනගැනීම සඳහාත්, මෙහි මෙතරම් දුක් දොම්නස් ඇත්තේ මක්නිසාද යන්න අවබෝධ කරගැනීමටත්, මරණයෙන් පසු අප වෙනුවෙන් කුමක් ඉතිරිව ඇත්දැයි දැනගැනීම සඳහාත් කිසියම් මාර්ගයක් මා ඔබට ප්‍රදානය කරනවා පමණි.

වින් හයි ශාස්තෘවරිය.

අප දෙවියන්ගෙන් වෙන්කර ඇත්තේ අප තුළ ඇති කලබලකාරිබවයි. කිසිවකු ඔබට කතා කරන විට, ඔබේ දුරකතනය නාදවනවිට, ඔබ ඉවුම් පිහුම් කටයුතුවල යෙදී සිටින විට, නැත්නම් ඔබ මිතුරන් හා කතාකරමින් සිටින විට කිසිවකුට ඔබට සමීප විය නොහැක. දෙවියන් සම්බන්ධයෙන් සිදුව ඇත්තේද ඒ ටිකමය. ඔහු හැමවිටම අපට ආමන්ත්‍රණය කරන මුත්, ඔහු හා කතාබහ කිරීමට අපට වේලාවක් නැත

වින් හයි ශාස්තෘවරිය

# අති උත්තම චින්ග් හයි ශාස්තෘවරියගේ ජීවන චරිතයෙන් බිඳක්

අති උත්තම චින්ග් හයි ශාස්තෘවරිය උපත ලැබුවේ අව්ලක් වලය. වැදගත් පෙළපතකට අයත් ඇගේ පියා කීර්තිමත් වෛද්‍යවරයෙකි. කතෝලික දැරියක වශයෙන් හැදුණු වැඩුණු ඇයට තම ආච්චි අම්මාගෙන් බුද්ධාගමේ මූලික සිද්ධාන්ත හඳුනාගන්නට ලැබිණ. කුඩා අවදියේ සිටම දර්ශනවාදය හා ආගමක ඉගැන්වීම් ක්‍රම ගැන වයසට වැඩි උනන්දුවක් දැක්වූ ඈ සියළු සත්වයා වෙතද අසාමාන්‍ය දයානුකම්පාවක් දැක්වූවාය. 18 වැනි වියේදී චින්ග් හයි දැරිය අධ්‍යාපනය ලැබීම සඳහා එංගලන්තයටත් පසුව ප්‍රංශය හා ජර්මනිය යන රටවලටත් ගියාය. පසුව ජර්මනියේ රතු කුරුස සංගමයේ රැකියාවක නියුතුවූ ඈ ඒ අතරතුර ජර්මන් විද්‍යාඥයකු හා විවාහ වූවාය. එහෙත් කුඩා අවදියේ සිටම ඈ තුළවූ අභිමතාර්තය මුදුන් පමුණුවා ගනු වස්, සත්‍යාවබෝධය ලැබීමේ මගට පිවිසෙනු වස්, තම සැමියාගේද කැමැත්ත ඇතිව වසර දෙකකට සීමාවූ ඇගේ වාසනාවන්ත විවාහ ජීවිතය අවසන් කිරීමට සිදුවිය. මේ කාලය තුළ ඈ තමන්ට සමීප වියහැකිවූ ගුරුවරුන්ගේ උපදෙස් ඇතිව විවිධ භාවනා ක්‍රම හා අධ්‍යාත්මික විනය කම් පිළිබඳ අධ්‍යයනය කරන්නට

වූවාය. මිනිසුන්ගේ දුක් වේදනා නැති කිරීම තනි පුද්ගලයකුට එතරම් පහසුවෙන් කළ නොහැකි බව වටහාගත් එතුමිය මනුෂ්‍යයාගේ දුක් වේදනා අඩු කළ හැකි එකම මග තමන් විසින්ම සත්‍යාවබෝධ කර ගැනීම බව වටහා ගත්තාය. මෙය එකම අරමුණ කරගත් ඇ සත්‍යාවබෝධය ලබා ගැනීමේ නියම මඟ සොයමින් රට රටවල සංචාරය කළාය. පුරා වසර ගණනාවක් තිස්සේ විවිධ අත්හද බැලීම් පර්යේෂණ හා දුක් පීඩා විඳිමින් ගත කළ චින්ග් හයි ශාස්තෘවරිය අවසානයේදී ක්වැන් යින් ක්‍රමය සොයාගත් අතර ඒ අනුගමනය කරමින් හිමාල අඩවියේදී දිව්‍යමය බලයක් ලබා ගත්තේය. ගිහිගෙය අතහැර හිමාලය අඩවියට ගොස් නොකඩවා භාවනා පුහුණුවෙන් පසු ඇ සම්පූර්ණ සත්‍යාවබෝධය ලබා ගත්තාය. සත්‍යාවබෝධය ලැබීමෙන් පසු චින්ග් හයි ශාස්තෘවරිය බෞද්ධ මෙහෙණියකගේ නිහඬ නිරහංකාර ජීවිතයක් ගෙවීය. ස්වභාවයෙන් ලජ්ජාශීලී තැනැත්තියකවූ ඇ බොහෝවිට මිනිසුන්ගෙන් ඈත්වී ජීවත්වීමට උත්සාහ ගත්තාය. එහෙත් පසුව තායිවානයේ හා අමෙරිකාවේ උන් ඇගේ මුල්ම අනුගාමිකයින්ගේ ඉල්ලීම අනුව ඇ ලොව පුරා දේශනා කිරීමට පටන් ගත් අතර ඇගේ අනුගාමිකයන් සිය දහස් ගණනින් වැඩිවන්නට විය.

අද ලොව පුරා විවිධ රටවලට අයත් සත්‍ය සොයායන සියළුම ආගම් ලබ්ධිකයෝ ඇගේ පරම සත්‍යය වටා එක් රොක් වෙමින් සිටිති. අති උත්තම ශාස්තෘවරිය සත්‍යාවබෝධය ලැබීමට ක්ෂණික මග වශයෙන් ඇ විසින්ම සොයා ගත් පරම සත්‍යය එනම් ක්වාන් යින් ක්‍රමය පුහුනු කිරීමටත් අවංක පුද්ගලයන්ට භාවනාව ඇරඹීම සඳහා අධ්‍යාත්මික උපදෙස් ලබාදීමටත් සූදානමින් සිටී.